# ස්ත්‍රීත්වය පිළිබඳ බෞද්ධ ආකල්පය

## The Buddhist Attitude on Womanhood

මැදවච්චියේ සංඝානන්ද හිමි

**Abstract**

The nation of woman has become a philosophical proposition among the philosophers in the modern era. She has received high acceptance in some ethnic societies and also received lower acceptance in some ethnic societies. Women's liberation movement started to get their rights, due to their lower recognition. Women's liberation movement has presented their opinions in connection with Buddhism. One of the main accusations they raise against Buddhism is that woman has been belittled in Buddhist sermons as well. When scrutinizing Buddhist sermons, it is clear that Buddhism pays attention to the needs of woman. When God of destruction (Mara) invited Buddha to pass away, Buddha expressed to the God of destruction that the day when monks, nuns, male and female disciples will be upholding doctrine, upholding discipline, I will pass away. That fact reflects that the Buddha expected pleasantness of the Buddhist order; both of the lay and the monastic. Though there are books written on Buddhist attitude about woman, almost all these books have mentioned about the order of nuns. There isn't any information regarding woman in those books. This study is based on Buddhist attitude on womanhood, and research is carried out using bibliography research methodology and primary sources.

**Keywords:** Woman, Buddhism, Wife, Marriage life, Husband

**සාරසංක්ෂේපය**

ස්ත්‍රිය පිළිබඳ කතිකාවත නූතන යුගයේ දාර්ශනිකයන් අතර දාර්ශනික ප්‍රස්තුතයක් බවට පත් වී ඇත. එයට හේතුව ලෙස ඇතැම් ජනවාර්ගික සමාජයන් තුළ ස්ත්‍රියට ඉහළ පිළිගැනීමක් තිබීමත්, ඇතැම් ජනවාර්ගික සමාජයන් තුළ ස්ත්‍රිය පහත් තත්ත්වයට දමා තිබීමත් පෙන්වා දිය හැකි ය. ස්ත්‍රියට පහත් තත්ත්වයක් ලැබීම නිසාවෙන් සිය අයිතිවාසිකම් ලබාගැනීම සඳහා ස්ත්‍රී විමුක්තිවාදී ව්‍යාපාරය ආරම්භ කරන්නට යෙදුණි. මෙම ස්ත්‍රී විමුක්තිවාදීන් සිය අදහස් බුදුදහම සම්බන්ධයෙන් ද ඉදිරිපත් කර ඇත. ඔවුන් එලෙස බුදුදහම සම්බන්ධයෙන් නගන ප්‍රධාන චෝදනාවක් වන්නේ බෞද්ධ දේශනාවන් තුළ ද ස්ත්‍රිය පහත් කොට සළකා ඇති බවයි. බුද්ධ දේශනාවන් විමර්ශනාත්මකව බලන විට ගම්‍යවන කාරණය වන්නේ බුදුසමය ස්ත්‍රිය සම්බන්ධයෙන් ද සාවදානව බලා ඇති ආකාරයයි. මාරයා බුදුන් වහන්සේට පිරිණිවන් පාන ලෙස දන්වා සිටින විට බුදුන් වහන්සේ මාරයා හට ප්‍රකාශ කර සිටියේ භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන පිරිස යම් දවසක ධර්මධර, විනයධර, ධම්මානුධම්ම ප්‍රතිපත්තියෙහි යෙදෙන්නේ එදින පිරිණිවන් පාන බවයි. බුදුන් වහන්සේගේ එම කරුණින් පිළිබිඹු වන්නේ බුදුන් වහන්සේ බුද්ධ ශාසනයෙහි අභිවෘද්ධිය ගිහි, පැවිදි යන දෙපාර්ශයෙන් ම බලාපොරොත්තු වූ බවයි. ස්ත්‍රිය සම්බන්ධයෙන් බුදුසමයේ දක්වා ඇති ආකල්පයන් පිළිබඳ ග්‍රන්ථයන් රචනා වී තිබුණ ද, ඒ සෑම ග්‍රන්ථයකම පාහේ දක්වා ඇත්තේ භික්ෂුණී ශාසනය පිළිබඳවය. එම ග්‍රන්ථයන් තුළ ගිහි කාන්තාවන් පිළිබඳව බුදුසමය දක්වා ඇති ආකල්පය පිළිබඳ තොරතුරු දැකගත නො හැක. ස්ත්‍රීත්වය විෂයෙහි බුදුසමය දක්වා ඇති ආකල්පය කෙබඳු ද? යන පර්යේෂණ ගැටළුවට ප්‍රාථමික මූලාශ්‍රයන් උපයෝගි කරගනිමින් ග්‍රන්ථ සන්ධාර පර්යේෂණ ක්‍රමවේදය මඟින් මෙම පර්යේෂණය සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

**යතුරු පදඃ** ස්ත්‍රිය, බුදුසමය, බිරිඳ, විවාහ ජීවිතය, ස්වාමියා

**හැඳින්වීම**

සමාජ සන්දර්භය තුළ මානව සබඳතා ගොඩ නඟන කුඩාම ඒකකය වන්නේ පවුලයි. පවුලක් නිර්මාණය වන්නට නම් විවාහ

සම්බන්ධතාවයක් හා එම විවාහ සම්බන්ධතාවයේ ප්‍රතිඵලයක් ලෙස දරුවන් බිහිවිය යුතු ය. මෙහි දී පවුලේ අභිවෘද්ධිය වෙනුවෙන් ස්ත්‍රිය සිදුකරන සේවාව ප්‍රශස්තනීය ය. සාර්ථක යුග දිවියක් ගතකිරීම සඳහා ස්ත්‍රියගෙන් සිදුවන සේවාව ද මෙහිලා අමතක නොකළ යුතු ය. ඇය ගෘහණියක් ලෙස නිවසේ කටයුතු සිදුකරමින්, දරුවන් පෝෂණය කරමින් අපිරිමිත සේවාවක් සිදු කරන්නේ ය. බොහෝ පවුල් සංස්ථාවන් තුළ ගැටුම් නිර්මාණය වීමට හේතුවක් වී ඇත්තේ තම තමන්ගේ යුතුකම් හා වගකීම් හඳුනා නො ගැනීමයි. එම නිසා ම නූතනය වන විට දික්කසාද වීමේ ප්‍රවණතාව ඉතාමත් සීඝ්‍ර ලෙස වර්ධනය වී ඇත. බුදුදහම වනාහි සත්ත්වයා සසරෙන් එතෙර කිරීමට පමණක් ම දේශනා කළ දහමක් නො වේ. ලෞකික ජීවිතය ගතකරන සත්ත්වයින් හට ද සාර්ථක ජීවිතයක් ගතකරන ආකාරය සම්බන්ධ ඉගැන්වීම් බුද්ධ දේශනාවන් තුළ අන්තර්ගත වී ඇත.

බුදුන් වහන්සේ පහළ වන යුගය වන විට භාරතයේ ආගමික දර්ශනය ශ්‍රමණ සම්ප්‍රදාය හා බ්‍රාහ්මණ සම්ප්‍රදාය යනුවෙන් කොටස් දෙකක් යටතේ ක්‍රියාත්මක විය. බ්‍රාහ්මණ සම්ප්‍රදාය යටතේ ස්ත්‍රිය දැඩි අවඥාවට ලක් වූ තැනැත්තියක් බවට පත් වී සිටි අතර, ශ්‍රමණ සම්ප්‍රදාය යටතේ ඇයට සීමිත නිදහසක් ලැබී තිබුණි. නමුත් එම නිදහස ඇයට විමුක්තිය ලබා ගැනීමට උපකාරී නොවීය. කාන්තාවට සමාජයේ සැබෑ අයිතිය හිමි වූයේ බුදුන් වහන්සේගේ පහළ වීමෙන් පසුව යැයි පැවසීම සාධාරණය. බුද්ධ දේශනාවට අනුව ස්ත්‍රිය දැරිවියක්, බිරිඳක්, ගෘහණියක්, උපාසිකාවක්, සාමණේරවරියක් හා රහත් තෙරණියක් ලෙස සමාජයේ හුවා දක්වා ඇත. එසේ ම ඇයගෙන් සමාජයට සිදුවන සේවාව සම්බන්ධයෙන් හා ඇයගේ වටිනාකම සම්බන්ධයෙන් බුදුසමය අදහස් දක්වා ඇත. මෙම පර්යේෂණයෙන් සිදු කරනුයේ එලෙස ස්ත්‍රිය සම්බන්ධයෙන් බුදුසමයේ දක්වා ඇති අදහස් පිළිබඳව විමර්ශනයක් සිදු කිරීමයි.

**සාහිත්‍ය විමර්ශනය**

හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමියන් විසින් (2002) රචිත පුරාතන භාරතීය කාන්තාව නම් ග්‍රන්ථයෙහි කාන්තාව සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කර ඇති නමුත් එහි දක්නට ලැබෙන්නේ වෛදික

යුගයේ කාන්තාව, බ්‍රාහ්මණ යුගයේ කාන්තාව හා බෞද්ධ යුගයේ කාන්තාවගේ පැවිද්ද සම්බන්ධයෙනි.

පානදුරේ වජිරා සිල්මාතාව විසින් (2003) රචිත භික්ෂුණී වංශය නම් ග්‍රන්ථයෙහි දක්නට ලැබෙන්නේ භික්ෂූණීන් වහන්සේලා පිළිබඳ තොරතුරු පමණි. එහි ගිහි කාන්තාව සම්බන්ධයෙන් තොරතුරු දක්වා නොමැත.

පල්ලන්තර සුමනජෝති හිමියන් විසින් (2003) රචිත බුදුරජාණන් වහන්සේ ලබාදුන් කාන්තා නිදහස හා විමුක්තිය නම් ග්‍රන්ථයෙහි දක්නට ලැබෙන්නේ භික්ෂුණීන් වහන්සේලා පැවිද්ද ලබාගැනීම සම්බන්ධයෙන් කටයුතු කළ ආකාරය පිළිබඳව ය. එහිදී ගිහි කාන්තාවන් විෂයයෙහි බුදුන් වහන්සේ දී ඇති උපදෙස් පිළිබඳ තොරතුරු ඇතුළත් කර නොමැත.

යථෝක්ත ග්‍රන්ථයන් සෑම එකක ම පාහේ දැකගතහැකි පොදු ලක්ෂණය වන්නේ එම ග්‍රන්ථයන් තුළ සඳහන් වී ඇත්තේ වෛදික යුගයේ කාන්තාවගේ ස්වරූපය, බ්‍රාහ්මණ යුගයේ කාන්තාවගේ ස්වරූපය හා බුදුසමය තුළ කාන්තාව පැවිදි වී ලබාගත් ආධ්‍යාත්මික සුවය පිළිබඳවය. මෙම ග්‍රන්ථයන් තුළ ගිහි කාන්තාව සම්බන්ධයෙන් බුදුසමය දක්වා ඇති අදහස් ඉතා විරලය. එබැවින් මෙම පර්යේෂණය ගිහි කාන්තාව සම්බන්ධයෙන් සිදු කරනු ලැබේ.

**පර්යේෂණ ගැටලුව**

බ්‍රාහ්මණ සමාජයෙන් පහත් කර දැමූ කාන්තාවට බුදුසමයෙන් සමාජයේ නිසි වටිනාකම ලැබුණේ ද?

**පර්යේෂණ අරමුණ**

මෙම පර්යේෂණයේ මූලික අරමුණ වන්නේ ගිහි කාන්තාව සම්බන්ධයෙන් බුදුසමය දක්වා ඇති ආකල්පය පෙන්වාදීමයි. එමෙන් ම යහපත් පවුල් දිවියක් ගත කිරීමට අවශ්‍ය බෞද්ධ මාර්ගෝපදේශය ද මෙම පර්යේෂණයෙන් පෙන්වා දී ඇත.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය සඳහා ග්‍රන්ථ සන්ධාර පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ ප්‍රාථමික මූලාශ්‍ර අධ්‍යයනය කරමින් අවශ්‍ය විටකදී ද්විතීයික මූලාශ්‍රයන් ද අධ්‍යයනය කිරීමට අපේක්ෂිතය.

**පර්යේෂණයේ වැදගත්කම**

යහපත් පවුල් ජීවිතයක් ගත කිරීමට කැමති ඕනෑම ස්ත්‍රියකට මෙන් ම ධාර්මික ජීවිතයක් ගත කිරීමට කැමති ඕනෑම ස්ත්‍රියකට ද මෙම පර්යේෂණය ඉතාමත් වැදගත් වේ. සූත්‍ර පිටකය පුරා විසිරී ඇති කාන්තාව පිළිබඳ ඉගැන්වීම් එක පිඬකට ගැනීම මෙහි ඇති වැදගත්කමයි.

**සාකච්ඡාව**

ස්ත්‍රීත්වය පිළිබඳ ප්‍රස්තුතය නූතන යුගයේ ආරම්භ වූවක් නො වේ. එය බුද්ධකාලීන භාරතීය සමාජයටත් එහා ගිය වෛදික යුගය දක්වා ම දිව යන්නකි. වෛදික යුගයේ දී ස්ත්‍රියට ඉහළ සමාජ පිළිග ැනීමක් තිබූ බව පුරාණ වෛදික ග්‍රන්ථයන් සාක්ෂි සපයයි. වෛදික යුගයේ විසූ ගාර්ගී වාචක්වනී නම් බහුශ්‍රැත කාන්තාවක් යඥවල්කය නම් ඍෂිවරයා සමඟ ධර්ම සාකච්ඡාවලට පැමිණ ඔහුගෙන් සූක්ෂම ප්‍රශ්න ඇසූ බවත්, ඒවාට පිළිතුරු දිය නො හැකි වූ ඔහු විමතියට පත් වූවේ ය. (බෂාම්, 2012: 234). මේ තුළින් ගම්‍යවන්නේ එකල සමාජයේ කාන්තාවන් තුළ පැවති බුද්ධි මට්ටම හා වාදයෙහි ඇති පරිපූර්ණත්වයයි. එමෙන් ම වෛදික යුගයේ කාන්තාවට ස්ව අභිමතය පරිදි කටයුතු කිරීමේ අයිතිය පැවති බව ද මේ තුළින් ස්ඵුට වේ.

වෛදික යුගයේ කාන්තාවගේ තත්ත්වය එසේ වූවත්, පශ්චාත් වෛදික යුගය වන විට බ්‍රාහ්මණිකයන්ගේ පිබිදීමත් සමඟ සමාජයේ ඉහළ ස්ථරයක සිටි ස්ත්‍රිය පහත් කොට සළකන්නට යෙදුණි. ස්ත්‍රිය පිළිබඳ බමුණු මතය වූයේ කාන්තාව කුඩා කාලයේ දී පියා යටතේත්, විවාහ වූවායින් පසුව ස්වාමියා යටතේත්, වැන්දඹුවකු වූවහොත් තම පුතණුවන් යටතේත් සිටිය යුතු බවයි. මෙම ඉගැන්වීමට අනුව කාන්තාවට ස්වච්ඡන්දව වැඩ කිරීමට නො හැකි වන අතර, ඇය

උපතේ සිට මරණය දක්වා ම වහලියක මෙන් අන්‍ය උපදෙස් යටතේ ජීවත් විය යුතු යි.

ස්ත්‍රිය පිළිබඳ සාකච්ඡා කිරීමට ප්‍රථමයෙන් 'ස්ත්‍රිය' යන්නෙහි වචනාර්ථ විග්‍රහය වීමංසනය කිරීම ප්‍රායෝගික ය. 'ඉත්ථි' යන්නෙන් වනිතාව, ස්ත්‍රිය යන්නත්, 'ඉත්ථිලිඞ්ග' යන්නෙන් ස්ත්‍රී ස්වභාවය, යෝනිය, නිමිත්ත යන අරුත් සපයනු ලබයි. (බුද්ධදත්ත හිමි, 2016: 119). 'කාන්තා' යන්නෙන් ස්ත්‍රී, කත, ලක්ෂණ සම්පන්න ස්ත්‍රිය යන අරුත් ද, 'නාරි' යන වචනය තුළින් ස්ත්‍රී, කාන්තාව යන අරුත් සපයනු ලබයි. 'ස්ත්‍රී' යන වචනය තුළින් කාන්තාව, යෞවනිය යන අරුත් ද, 'ස්ත්‍රී ධර්ම' යන්නෙන් ස්ත්‍රීන්ගේ ස්වභාවය, ඍතු කාලය, මල්වරවීම යනාදී අර්ථයන් ද, 'ස්ත්‍රී ලිංග' යන්නෙන් ස්ත්‍රී සළකුණ, ස්ත්‍රී චින්නය යන අර්ථයන් ද, 'ස්ත්‍රීස්වභාව' යන්නෙන් ස්ත්‍රී ගතිය යන අර්ථයන් ද ප්‍රකට වේ. (රේවත හිමි, 2001: 179, 403, 698). 'ඉත්ථින්ද්‍රිය' යන්නෙන් ස්ත්‍රී භාව රූපය, ස්ත්‍රියගේ ශරීරය පුරාම විසිරී ඇති ස්ත්‍රී ලක්ෂණයයි. මෙය දෙවිසි ඉන්ද්‍රියන්ගෙන් හෝ අටවිසි රූපවලින් එකකි. සත්ත්ව ශරීරයට ස්ත්‍රී ස්වභාවය ගන්වන රූපයයි. මෙම භාව රූප ප්‍රතිසන්ධි චිත්තය සමඟ ඇති වේ. එහිම 'ඉත්ථිධුත්ත' යන්නෙන් ස්ත්‍රීන් කෙරෙහි ලොල් තැනැත්තා හඳුන්වනු ලබන අතර, 'ඉත්ථිභාව' යන්නෙන් ගැහැණුකමත්, 'ඉත්ථිලිඞ්ග' යන්නෙන් ස්ත්‍රී නිමිත්ත, ස්ත්‍රී රහසඟ, යෝනිය යන අරුත් ප්‍රකට කරයි. (ලියනගේ, 286). 'අදපැබ' යන ඉංග්‍රීසි පදයට මලලසේකර ශබ්දකෝෂය අරුත් දක්වා ඇත්තේ පුරුෂයන් නායකත්වය දරන පවුලක ගැහැණු ජනයා, ස්ත්‍රී වර්ගයා, පවුලක ගැහැණු උදවිය යනාදියයි. එහි ම 'womenkind' යන්නෙන් ස්ත්‍රී වර්ගයා යන අරුතත් 'women right' යන්නෙන් කාන්තා අයිතිවාසිකම් පෙන්වා දී ඇත. (මලලසේකර, 2014: 1980-1981). 'women's liberation' යන්නෙන් පිරිමින්ට මෙන් සමාජයේ අයිතිවාසිකම් වෙනුවෙන් සිදුකරන කාන්තා විමුක්ති ව්‍යාපාරය හඳුන්වා ඇත. (Kavanagh, 1996: 1372).

දීර්ඝ කාලයක් සාමාජීය වශයෙන් ද, ආගමික වශයෙන් ද පීඩාවෙන් පෙළුණු භාරතීය කාන්තාවට බෞද්ධ යුගය උදාවෙත් ම සැනසීමේ දොරටු විවෘත විය. බුද්ධ සූර්යයා උදාවෙත් ම අප්‍රාණිකව මලානිකව වැතිරී සිටි කාන්තා පද්මයෝ මහා කරුණා දිය දහරින්

ප්‍රාණවත්ව, පැන නැඟී, ප්‍රබෝධමත් වී ලෝකෝත්තර විමුක්තිය ලබා සීල සුගන්ධයෙන් ලොව සැනසූහ. ඇතැම් කාන්තා පද්මයෝ ලෞකික ජීවිතයේ උතුම් ගුණාංග නමැති රන්වන් රොනින් පැහැපත් වූහ. ලෝකයාට ද සෙතක් සැලසූහ. (වජිරා සිල්මාතාව, 2003: 30). බමුණන් විසින් බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශූද්‍ර යනුවෙන් බෙදා තිබූ සමාජය බුදුන් වහන්සේ විසින් භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යනුවෙන් සිව්වනක් පිරිසක් ඇති කළහ. මෙම සිව්වනක් පිරිස ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට විභජනය කළහොත් එය ගිහි හා පැවිදි යනුවෙන් හඳුනාගත හැකි ය. පැවිදි පාර්ශවයට භික්ෂුණීන් ද, ගිහි පාර්ශවයට උපාසිකාවන් ද ඇතුළත් කර තිබීමෙන් විශද වන්නේ බුදුසමය කාන්තාවට පිරිමියාට මෙන් සමාජයේ සම අයිතිය ලබා දී ඇති ආකාරයයි.

මාරයා විසින් බුදුරදුන්ට පිරිණිවන් පාන ලෙස දන්වා සිටි අවස්ථාවේ දී බුදුන් වහන්සේ මාරයාට ප්‍රකාශ කර සිටියේ මගේ ශ්‍රාවකත්වය ලබා භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වනක් පිරිස විශාරදව, ව්‍යක්තව, ධර්මධරව, විනයධරව මේ ශාසනයේ හැසිරෙන්නේ යම් දවසක ද එදින පිරිණිවන් පාන බවයි. මෙම ප්‍රකාශයෙන් අපට අවබෝධ කර ගත හැකි කාරණය වන්නේ පිරිමින්ගෙන් සේ ම කාන්තාවන්ගෙන් ද බුදුන් වහන්සේ තම අභිලාෂයන් බලාපොරොත්තුවෙන් සිටි බවයි. ලෝකාරම්භය පිළිබඳව පටිච්චසමුප්පන්නව, පරිණාමවාදීව කරුණු විග්‍රහ කරන බුදුසමය සත්ත්වයාගේ ලිංග පහළවීම ගැන සාකච්ඡා කිරීමට අමතක කර නොමැත. දීර්ඝ කාලයක් මුළුල්ලේ රස පඨවිය, භූමි පප්පටක හා බදාලතා අනුභව කළ සත්ත්වයින් බදාලතා අතුරුදහන් වීමෙන් පසු පහළ වූ හැල් වී කාලයක් තිස්සේ අනුභව කරමින් සිටි සත්ත්වයින්ට ලිංග පහළ විය. ලිංග පහළ වීමෙන් පසු ස්ත්‍රිය පුරුෂයා දෙසත්, පුරුෂයා ස්ත්‍රිය දෙසත් බලා සිටිමෙන් දෙපාර්ශවය තුළ ම රාගය ඇති වී මෛථූනයෙහි යෙදුණේ ය.

ඉත්ථියා ච ඉත්ථිලිඞ්ගං පාතුරහෝසි, පුරිසස්සච පුරිසලිඞ්ගං. ඉත්ථී ච සුදං 'පුරිසං අතිවේලං උපනිජ්ඣායතී, පුරිසෝ ච ඉත්ථිං. තේසං අතිවේලං අඤ්ඤමඤ්ඤං උපිනිජ්ඣායතං සාරාගෝ උදපාදි, පරිළාහෝ කායස්මිං ඔක්කමි. තේ පරිළාහපච්චයා මෙථූනං ධම්මං පටිසේවිංසු.' (දී. නි. 3, අග්ගඤ්ඤ සුත්ත, 2005: 150).

රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන කරුණු පහෙන් ස්ත්‍රිය පුරුෂයාගේ සිත වසඟ කරගන්නා අතර, එම කරුණු පහෙන් ම පුරුෂයා ද ස්ත්‍රියගේ සිත වසඟ කරගනු ලැබේ. (අං. නි. 1, 2005: 2-4). සමාජයක පැවැත්ම ඇතිවන්නේ කාන්තාවගේත්, පුරුෂයාගෙත් ලිංගික එකතුවකිනි. මව් කුසක දරු ගැබක් පහළ වීම සඳහා කරුණු 3ක් සම්පූර්ණ විය යුතු බව බුදුසමය පෙන්වා දෙනු ලබයි. එනම්,

1. මව්පියන්ගේ සංවාසය

2. මව ඔසප් වීම

3. ගන්ධබ්බයෙකුගේ පැමිණීම

යතෝ ච ඛෝ භික්ඛවේ මාතාපිතරෝ සන්නිපතිතා හොන්ති, මාතා ච උතුනී හොන්ති, ගන්ධබ්බෝ ච පච්චුපට්ඨිතෝ හෝති.' (ම. නි. 3, මහාතණ්හාසංඛය සුත්ත, 2005: 622).

යනුවෙනි. මෙනයින් බලන කල ප්‍රකට වන කාරණය වනුයේ දරුවෙකු බිහි කිරීමේ දී වැඩිම කාර්යභාරයක් ඉටු කරනු ලබන්නේ කාන්තාව බවයි. යථෝක්ත කාරණා තුනෙන් එකක් හෝ අසම්පූර්ණ වුවහොත් දරු ගැබ නො පිහිටන්නේ ය. මෙම කාරණා තුනටම ස්ත්‍රිය දායකත්වය සපයන අතර, පුරුෂයා පළමු කරුණට පමණක් දායකත්වය දක්වනු ලබයි. ගන්ධබ්බයාගේ ආගමනය මව් කුසට විනා පුරුෂ කුසට නො වේ. මානව වර්ගයා බිහි කිරීමේ භාරදූර කර්තව්‍ය ස්ත්‍රියගේ වැඩි දායකත්වයෙන් සිදුවන බවට මෙය හොදම සාක්ෂියයි.

සමාජ සංස්ථාව තුළ විවාහය යනු අතිශය වැදගත් සාධකයකි. යහපත් පවුල් ජීවිතයක් ගත කිරීමට නම් බිරිඳගේ සහ ස්වාමියාගේ අන්‍යොන්‍ය සම්බන්ධතාවය තිබිය යුතු ය. අන්‍යොන්‍ය සම්බන්ධතාවය ඇති වන්නට නම් දෙදෙනා ම තමන්ගෙන් විය යුතු යුතුකම් හා වගකීම් නිශ්චිතව හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කළ යුතු ය. සදිසා නමස්කාරයන් තුළ අඹු-සැමියන් බටහිර දිශාවට යොමු කර ඇත (පච්ඡිමා දිසා පුත්තාදාරා වේදිතබ්බා). (දී. නි. 3, සිඟාලක සුත්ත, 2005: 302). යුතුකම් හා වගකීම් පිළිබඳ කරුණු අනාවරණය කරන බුදුසමය ස්වාමියාගෙන් බිරිඳට විය යුතු යුතුකම් පහක් හා බිරිඳගෙන් ස්වාමියාට විය යුතු යුතුකම් පහක් පෙන්වා දී ඇත. එහි දී

මුලින්ම ස්වාමියා විසින් කරුණු පහකින් බිරිඳට සංග්‍රහ කළ යුතු ය. එම කරුණු පහ වනුයේ,

1. ප්‍රිය වචනයෙන් කතා කිරීම

2. අවමන් නො කිරීම

3. පරඹුවන් කරා නො යෑම

4. ගෙයි කටයුතුවල අධිපතිබව ඇයට දීම

5. ඇඳුම්, පැළඳුම් සපයා දීම (දී නි. 3, සිඟාලක සුත්ත, 2005ඃ 306).

මෙම කරුණු පහ දෙස විමර්ශනාත්මක චින්තනයකින් බලන විට පිළිඹිබු වන කාරණය වන්නේ පවුල් සංස්ථාව තුළ ස්වාමියාට මෙන් ම බිරිඳට ද සම අයිතිවාසිකම් පවතින බවයි. දෙදෙනාට ම සිදු කළ යුතු ගණන පහක් වීම තුළින් එය විශද වේ. පීතෘ මූලික පවුල් සංස්ථාවක කාන්තාවට ගෙයි කටයුතුවල අධිකාරීමය බලය ලබා දිය යුතු ය. එයට හේතුව නිවසේ සියලු කර්තව්‍යන් උදේ සිට රාත්‍රි වනතෙක් සිදු කරනු ලබන්නේ බිරිඳ නිසාවෙනි. අංගුත්තර නිකායේ කුමාරිකෝවාද සූත්‍රයේ දී පතිකුලයට යන යෞවනියන්ට යහපත් පවුල් ජීවිතයක් ගත කිරීම සඳහා උපදෙස් 5ක් ලබා දී ඇත. එනම්,

1. හැමටම පළමුව නින්දෙන් පිබිදිය යුතු ය. හැමටම පසුව නින්දට යා යුතු ය. හිමියාට සුවච විය යුතු ය. ඔහුගේ සිත් ගන්නා ලෙස කටයුතු කළ යුතු ය.

2. සැමියාගේ හරසරයට පාත්‍ර වූ මහණ බමුණන් හට ගරු සැලකිලි හා පුද සිරිත් කළ යුතු ය.

3. සැමියා අයත් ගේ දොර පිළිබඳ කටයුතු වල දක්ෂ විය යුතු ය. ඒවා පිරික්ෂා බලා විධිමත් අන්දමින් සංවිධානය කළ යුතු ය.

4. සැමියාගේ අතවැසියන්ටත්, සේවකයන්ටත් නිසි යුතුකම් ඉටු කළ යුතු ය. ගිලනුන්ගේ සුව දුක් විමසා බලා නිසි ආහාර පානාදිය සැපයිය යුතු ය.

5. සැමියාගේ ධනය මනාව රැකිය යුතු ය. වෙන පුරුෂයන් හා නො මනා ලෙස හැසිරීමටත්, ධනය විනාශ නො කිරීමටත් වග බලා ගත යුතු ය.

සාර්ථක විවාහ ජීවිතයක් ගතකිරීම සඳහා බිරිඳ සහ ස්වාමියා අතර තිබිය යුතු ගුණ ධර්මයන් සම්බන්ධයෙන් ද බුදුසමය කරුණු ඉදිරිපත් කර ඇත. මළ පුරුෂයෙක් මළ ස්ත්‍රියක් සමග වාසය කිරීම, මළ පුරුෂයෙක් දෙව්දුවක් සමග වාසය කිරීම, දෙවියෙක් මළ ස්ත්‍රියක් සමග වාසය කිරීම හා දෙවියෙක් දෙව්දුවක් සමග වාසය කිරීම යනුවෙනි.

ඡවෝ ඡවාය සද්ධිං සංවසති, ඡවෝ දේවියා සද්ධිං සංවසති, දේවෝ ඡවාය සද්ධිං සංවසති, දේවෝ දේවියා සද්ධිං සංවසති' (අං. නි. 2, පඨමසංවාස සුත්ත, 110).

මෙම සූත්‍රයට අනුව 'මළ' යන්නෙන් අර්ථ ගන්වා ඇත්තේ පන්සිල් ආරක්ෂා නො කරන, මහණ බමුණන්ට අක්‍රෝශ පරිභව කරන, දුස්සීලයෙහි නියුක්ත ස්වාමියා හා බිරිඳයි. 'දෙව්' යන අර්ථයෙන් දක්වා ඇත්තේ පන්සිල් සුරකින, මහණ බමුණන්ට ගරුකරන, ධර්මයෙහි හැසිරෙන ස්වාමියා හා බිරිඳයි. දෙදෙනාම ගුණධර්මයන්ගෙන් සුපෝෂිතව කටයුතු කරන්නේනම් මරණින් මතු දිව්‍ය සම්පත් උදා කරගතහැකි බව බුදුසමය තවදුරටත් පෙන්වා දෙයි.

ඉධ ධම්මං චරිත්වාන සමසීලබ්බතා උභෝ

නන්දිනෝ දේවලෝකස්මිං මෝදන්ති කාමකාමිනෝති' (අං. නි. 2, පඨමසංවාස සුත්ත, 114).

රූමත් බව, ධනය තිබීම, සිල්වත් බව, අනලස් බව හා දරුවන් ලැබීම යන කරුණු පහෙන් යුක්ත ස්ත්‍රිය පුරුෂයාගේ හිත දිනාගන්නා බවත්, එම කරුණුවලින් සමන්විත නො වන ස්ත්‍රිය පුරුෂයාගේ වසඟයට පත් නො වන බවත් බුදුසමය පෙන්වා දෙයි. (සං. නි. 4, මාතුගාම සුත්ත, 450). එසේම පුරුෂයා ද යථෝක්ත කරුණු වලින් සමන්විත වන්නේනම් පමණක් ස්ත්‍රියගේ සිත දිනාග න්නා බවත්, එසේ නො වන්නේ නම් ස්ත්‍රියගේ සිත දිනාගැනීමට

නො හැකි බවත් බුදුසමය තව දුරටත් විස්ථාරණය කරනු ලබයි. (සං. නි. 4, පුරිස සුත්ත, 450).

පිරිමියා නො විඳින කාන්තාව පමණක් විඳින දුක් පහක් පිළිබඳව ද බුදුසමය කරුණු ඉදිරිපත් කර ඇත. එම දුක්ඛයන් වනුයේ,

1. තරුණ වියේදී නෑදෑයින්ගෙන් වෙන්ව පතිකුලයට යෑම

2. ඔසප් වීම

3. ගැබ් ගැනීම

4. දරුවන් ප්‍රසූත කිරීම

5. තම ස්වාමියා වෙනත් ස්ත්‍රියක් හා සිටිනු දැකීම (සං. නි. 4, ආවේණික දුක්ඛ සුත්ත, 450, 452).

බ්‍රාහ්මණික ඉගැන්වීම්වලට අනුව බහුභාර්යා විවාහය සමාජ සම්මත විවාහයක් විය. බමුණන්ට අනුව කාන්තාව යනු ලිංගික භාණ්ඩයකි. එබැවින් එක් බමුණෙකු කාන්තාවන් කිහිප දෙනෙකු සමග විවාහ විය. තම ස්වාමියා වෙනත් කාන්තාවක් සමග සිටිනු දැකීමට කිසිම කාන්තාවක් කැමති වන්නේ නැත. එය සෑම කාන්තාවකටම ආවේණික ලක්ෂණයකි. අනියම් සම්බන්ධතාවයක් යනු පවුල් ජීවිතයක් දෙදරා යෑමට බලපාන ප්‍රධාන සාධකයකි. කාන්තාව පමණක්ම විඳින යථෝක්ත දුකබයන් පහ ස්වාමියා අවබෝධ කරගන්නේ නම් සාර්ථක යුග දිවියක් ගත කිරීමට හැකියාව ලැබෙනවා සේ ම කාන්තාවට ද සමාජයේ නිසි වටිනාකම හිමිවන්නේ ය.

විවාහ ජීවිතය පිළිබඳ කරුණු ඉදිරිපත් කරන බුදුසමය බිරින්දෑවරු සත් දෙනෙක් පිළිබඳ තොරතුරු අනාවරණය කර ඇත. එම බිරින්දෑවරු සත්දෙනා වනුයේ,

1. වධක භාර්යාව

යම් බිරිඳක් දුෂ්ට සිත් ඇත්තී ද, ස්වාමියාට අනුකම්පා නැත්තී ද, පර පුරුෂයන් කෙරෙහි ඇලුනේ ද, සිය හිමියා පහත් කොට හිතයි ද, සිය සැමියාට වධ හිරිහැර කරන්නී ද, හෙතෙම වධක භාර්යාව වේ.

2. චෞර භාර්යාව

ස්වාමියා ශිල්පයෙන් හෝ කර්මාන්තයෙන් හෝ සී සෑමෙන් හෝ යම් ධනයක් ලැබුවේ නම් එයින් ටිකක් හෝ ගැනීමට, වැනසීමට කැමති වේ ද හෙතෙම චෞර භාර්යාවයි.

3. ස්වාමි භාර්යාව

වැඩ කිරීමට නො කැමති, අලස බොහෝ අනුභව කරන, ක්‍රෝධශීලී, රළු බස් තෙපුලන, සැමියා යටත් කොට වෙසෙන බිරිඳයි.

4. භගිනි භාර්යාව

යම් බිරිඳක් බාල නැගණිය වැඩිමහල් සොහොයුරු කෙරෙහි යම් සේ පවතින්නේ ද, එසේ තමාගේ ස්වාමියා කෙරෙහි ගෞරව සහිත ද, ලජ්ජාශීලී ද, ස්වාමි පුරුෂයාගේ කැමැත්තට අනුකූලව හැසිරෙන්නේ ද, හෙතෙම භගිනි භාර්යාවයි.

5. සඛී භාර්යාව

යෙහෙළිය බොහෝ කළකින් පැමිණි යහළුවකු දැක සතුටු වන්නාක් මෙන් යම් බිරිඳක් සිය සැමියා දැක සතුටු වන්නී ද, හිමියා දෙවි කොට වසන්නේ ද හෙතෙම සඛී භාර්යාව වේ.

6. දාසී භාර්යාව

සිය හිමියා තර්ජනය කරද්දීත් නො කිපෙන්නේ ද, ශාන්ත ද, දුෂ්ට නො වන්නේ ද, ක්‍රෝධ නො කරන්නේ ද, සැමියාගේ කැමැත්ත අනුව පවතින්නේ ද හෙතෙම දාසී භාර්යාව වේ.

7. මාතෘ භාර්යාව

යම් බිරිඳක් සෑම කල්හි ම ස්වාමියාට හිතවත් ද, අනුකම්පා වේ ද, පුතකු රක්නා මවක මෙන් සැමියා ආරක්ෂා කරන්නේ ද, ධනය ආරක්ෂා කරන්නේ ද හෙතෙම මාතෘ භාර්යාව වේ. (අං. නි. 4, සත්තභරියා සුත්ත, 2005ඃ 416-418).

මෙම බිරින්දෑවරු පිළිබඳව තවදුරටත් කරුණු ඉදිරිපත් කරමින් බුදුන් වහන්සේ දේශනා කරන්නේ පළමු බිරින්දෑවරු තිදෙනා මරණින් මතු දුගතියෙහි උපදින බවත්, අවසන් බිරින්දෑවරු සතරදෙනා මරණින් මතු සුගතියෙහි උපදින බවත්

වරක් කොසොල් රජතුමා බුදුරජාණන් වහන්සේගේ අභිමුඛයෙහි සිටින විට මල්ලිකා දේවිය දරුවෙකු බිහිකළ බවත්, එම දරුවා දියණියක් බවත් ඇමතියෙකුගේ මාර්ගයෙන් දැනගත් රජතුමා තම දරුවා දියණියක වීම ගැන කනස්සල්ලට පත් වූයේ එවකට පැවති සමාජයේ කාන්තාව පිළිබඳ දැඩි අප්‍රසාදයක් මෙන් ම කාන්තාව පහත් තත්ත්වයට ද හෙළා තිබීම නිසාවෙනි. මෙය දැනගත් බුදුන් වහන්සේ රජතුමාට සඳහන් කර සිටියේ ඇතැම් ස්ත්‍රීන් පිරිමින්ට වඩා ශ්‍රේෂ්ඨ වන බවත්, නුවණැති බවත්, සිල්වත් බවත්, සැමියා දෙවියන් කොට සලකන බවත්, පතිවත රකින බවත්, ඇයට යම් පුතෙක් උපදී ද ඔහු දිශා අධිපති වන බවත්, එබදු වාසනාවන්තියගේ පුතා රජකම් පවා කරන බවත් ය.

ඉත්ථී පි හි ඒකච්චයා සෙය්‍යා පෝස ජනාධිප - මේධාවිනී සීලවතී සස්සුදේවා පතිබ්බතා

තස්සා යෝ ජායතී පෝසෝ සූරෝ හෝති දිසම්පති - තාදිසා සුභගියා පුත්තෝ රජ්ජම්පි අනුසාසතීති' (සං. නි. 4, ධීතු සුත්ත, 2005: 158).

රූප බලය, ධන බලය, ඥාති බලය, පුත්‍ර බලය හා සීල බලය යන පඤ්ච බලයන් ස්ත්‍රිය සතුව පවතින අතර, ස්ත්‍රිය තුළ සීල බලය පමණක් තිබීමෙන් මරණින් මතු ස්වර්ග සම්පත් ලබා ගත හැක. (සං. නි. 4, හේතු සුත්ත, 2005: 470). රූප බලය, ධන බලය, ඥාති බලය හා පුත්‍ර බලය යන බල සතර ලෞකික ජීවිතයට පමණක් ප්‍රයෝජනවත් වන අතර, සීල බලය ආධ්‍යාත්මික දියුණුව ඇති කරනු ලබයි. බුදුන් වහන්සේ කාන්තාවන්ගේ විමුක්ති සුවය ගැන ද දේශනා කර තිබීමෙන් අනාවරණය වන්නේ බමුණන් විසින් පහත් කර කථා කර ඇති ස්ත්‍රියට ද විමුක්තිය උදා කර ගැනීමට තම ස්ත්‍රීත්වය බාධාවක් නො වන ආකාරයයි.

ගෝපිකා නම් ස්ත්‍රී දුවක් බුදුන් කෙරෙහි, දහම් කෙරෙහි, සංඝයා කෙරෙහි පැහැදී, සීලයෙන් පරිපූර්ණත්වයට පැමිණ පුරුෂ සිත් වඩා මරණින් මතු තව්තිසා දිව්‍ය ලෝකයේ ගෝපක නම් දිව්‍ය පුත්‍රයා වී ඉපදුණේ ය. (දී. නි. 2, සක්කපඤ්හ සුත්ත, 2005: 406-408). පිරිමි බව ලැබීම සෑම ස්ත්‍රියක් තුළ ම ඇති අපේක්ෂාවකි. එවැනි අපේක්ෂාවන් ඇති අයට පිරිමි බවක් ලබා ගැනීම සඳහා කළ යුතු කර්තව්‍යයන් සඳහන් කර තිබීමෙන් ගම්‍ය වන්නේ බුදුන් වහන්සේ ස්ත්‍රිය කෙරෙහි සානුකම්පිත වී ඇති ආකාරයයි. අප බෝධිසත්ත්වයන් වහන්සේ ද බුද්ධත්වය ලබාගැනීම සඳහා ඉති කුමාරිව ඉපිද සිටි සමයේ පුරුෂ සිත් වඩා මරණින් මතු දිව්‍ය ලෝකයේ උපන් බව ජාතක පාළියේ සඳහන් වේ.

යම් ස්ත්‍රියකට නිම්මාණරතී දිව්‍ය ලෝකයේ උපන්නට අවැසි නම් එබදු ස්ත්‍රිය විසින් පූරණය කළ යුතු කරුණු 8ක් බුදුසමය පෙන්වාදෙයි. එම කරුණු වනුයේ,

1. මව්පියවරු යහපත කැමතිව, හිතවත්ව, අනුකම්පාවෙන්, අනුකම්පාව උපදවා යම් ස්වාමියෙකුට ස්ත්‍රියක් දෙත් නම්, ඇය ඒ ස්වාමියාට පළමුව අවදිවන්නේ, හැමට පසුව නිදන්නේ, කුමක් කළ යුතු දැයි විමසන්නේ, ප්‍රියමනාප හැසිරීම් ඇතිව ප්‍රිය තෙපුල් ඇත්තේ වෙයි.

2. යම් ඒ ස්වාමියාගේ ගුරුවරු වෙත් ද, මව හෝ පියා හෝ වෙත් ද, ශ්‍රමණ බ්‍රාහ්මණයෝ හෝ වෙත් ද, ඔවුන්ට ද සත්කාර කරයි. ගරු කරයි. බුහුමන් කරයි. පුදයි. ස්වාමියා පැමිණි කල්හි ආසනයෙන් ද, පැනින් ද පුදයි.

3. ස්වාමියාගේ නිවසෙහි ඇති කටයුතු අතර එළු ලොම් කැපීම වේවා, කපු කැපීම වේවා එහිලා දක්ෂ වෙයි. අලස නැත්තේ වෙයි. කටයුතු සංවිධානය කිරීමෙහි උපාය වීමංසනයෙන් යුතු වෙයි.

4. ස්වාමියාගේ යම් ඒ අභ්‍යන්තර ජනයා වෙත් ද, මෙහෙකරුවන් වේවා, දාසයන් වේවා, කම්කරුවන් වේවා ඔවුන් කළ දේ කළ දේ වශයෙන් ද, නො කළ දේ නො කළ දේ වශයෙන් ද දන්නේ ය. ඔවුන්ගේ ගිලන් බවත්, බල-දුබල බවත් දන්නේ ය. කන

බොන දෑ ද බෙදා හදා දෙන්නේ ය.

5. තම ස්වාමියා යම් ධනයක් හෝ ධාන්‍යයක් හෝ රැගෙන එයි නම් එය ආරක්ෂා කරයි. එහිලා ධූර්ත නැත්තේ, සොර නැත්තේ, ලොල් නැත්තේ එය නො නසන්නේ වෙයි.

6. බුද්ධ රත්නය, ධර්ම රත්නය, සංඝ රත්නය සරණ ගිය උපාසිකාවක් වෙයි.

7. ඇය පඤ්ච සීලයෙන් සුපෝෂිත වන්නේ ය.

8. ත්‍යාගවන්තියක් වෙයි. මසුරුමල දුරු වූ සිතින් ගෙදර වසන්නේ වෙයි. දානය පිණිස අත් හැර කටයුතු කරන්නේ වෙයි. අනුන්ගේ ඉල්ලීමට සුදුසු වන්නේ වෙයි. දන් බෙදීමෙහි ඇලුණේ වෙයි. (අං. නි. 5, අනුරුද්ධමනාපකායික සුත්ත, 2005: 202-204).

මෙම කරුණු විමසීමෙන් පැහැදිලි වන කාරණය වන්නේ බුදුන් වහන්සේ පවුලේ සමඟිය පිළිබඳ උන්වහන්සේගේ අවධානය යොමු කර ඇති ආකාරයයි. ස්වාමි දියණිය මෙම කරුණු 8න් සුපෝෂිත වන විට ස්වාමියා ද නිරායාසයෙන් ම ධාර්මිකත්වයට පත් වන්නේ ය. එවිට පවුලේ සමඟිය ආරක්ෂා වනවා පමණක් නොව ඔවුනට පින්වන්ත දරුවන් ද ඉපදෙන්නේ ය. යම් හෙයකින් ස්වාමියා නොමග ගියේ වේ ද කාන්තාවට එයින් අවැඩක් නො වන්නේ ඇය මරණෙන් මතු නිම්මාණරතී දිව්‍ය ලෝකයේ උපදිනා හෙයිනි.

බුදුසමය පෙන්වාදෙන ආකාරයට ස්ත්‍රිය මැනවින් සකස් කොට කටයුතු කරන්නේ වෙයි ද, සිය පිරිවර ජනයා හට මැනවින් සංග්‍රහ කරන ලද්දේ වෙයි ද, සැමියා හට මනාප ලෙස හැසිරෙන්නේ වෙයි ද, සැමියා ඉපයූ දෙය රකින්නේ වෙයි ද එබඳු ස්ත්‍රිය මෙලොව දිනීමට සමත් වන බවත්, සද්ධා, සීල, චාග, පඤ්ඤා යන කරුණු හතරෙන් සමන්විත ස්ත්‍රිය පරලොව ද ජයග්‍රහණය කරනු ලබන බවත් ය. (අං. නි. 5, පඨමලෝකවිජය සුත්ත, 2005: 210).

**නිගමනය**

කාන්තා නිදහස මුල සිටම අගය කරන ශාස්තෘවරයෙක් හැටියට බුදුන් වහන්සේ එදා යස කුමරුටත්, ඔහුගේ මෑණියන්ටත්, එම භාර්යාවටත් දහම් දෙසූ අවස්ථාවන්හී දී දේශනා කරන ලද්දේ එකම සූත්‍ර දේශනාවකි. භික්ෂුණී ශාසනය ආරම්භ කිරීමේදී ද උන්වහන්සේ එය තර්කානුකූලව විමසා බැලූ සේක. එම අවස්ථාවේ දී ආනන්ද තෙරුන් වහන්සේ ඒ ගැන ප්‍රශ්න කළ විට බුදුන් වහන්සේ සඳහන් කළේ කාන්තාවන්ට උසස් බුද්ධියක් ඇති බවයි. කොසොල් රජතුමාට දේශනා කළ දේශනාවෙන් ඒ බව ස්ඵුට වේ. එම රජතුමා දුටු සිහින 16 ගැන මඟ පෙන්වා දුන්නේ ද, අසදෘශ දානය සඳහා අනුශාසනාවන් මෙන් ම සංවිධානය ද සිදු කරනු ලැබුවේ මල්ලිකා දේවිය විසිනි. බුදු සසුනට කාන්තාවන් ඇතුළත් කර ගැනීමේ දී බුදුන් වහන්සේ තත්කාලීන සමාජ හේතූන් නිසා වැඩි කැමැත්තක් නො දැක්වූ බව දැක ගත හැකි ය. එහෙත් නීති පනවා කාන්තා සමාජය භික්ෂුණීන් බවට පත් කිරීමෙන් පෙනීයන්නේ කාන්තා සමාජයට ක්‍රමානුකූලව ආගමික නිදහස ලබාදීමට බුදුන් වහන්සේ ක්‍රියාත්මක වී ඇති බවයි. බ්‍රාහ්මණ සමාජයේ දී පුරුෂාධිපත්‍යයට යට වූ කාන්තාවන් මෙසේ ආගමික හා සාමාජීය වශයෙන් නිදහස ලබද්දි එහි සීමාව ඉක්ම යා හැකි බවට අනාගත කාන්තාව පත්වේය යන චකිතය නිසාවෙන් අෂ්ඨගරු ධර්ම ඉදිරිපත් කර ඊට එකඟතාවය ලබා ගැනීමෙන් පසු ප්‍රථම වරට තම සුළු මෑණියන් හා 500ක් කාන්තාවන් පැවිදි කරවා කාන්තාවන්ට ආගමික නිදහස මෙන් ම බාධාවකින් තොරව විමුක්ති මාර්ගයේ ගමන් කිරීමට ද අවකාශ සලසා දුන්නේ ය.

මෙහිලා දැන්විය යුතු වැදැගත් කාරණයක් වන්නේ බුදුන් වහන්සේ කිසිවිටෙකත් ලිංග භේදය පදනම් කරගෙන දහම් නො දෙසූ බවයි. ලිංග භේදය වනාහි කාම භවයේ උපදින සත්ත්වයින්ට පමණක් උරුමවන දෙයකි. ධර්මය පිළිපදින්නේ නම් ස්ත්‍රී, පුරුෂ ඕනෑම කෙනෙකුට පරමතර විමුක්තිය ලබාගත හැකි බව බුදුසමය පෙන්වා දෙයි. බුදුසමයේ පරමාර්ථය වන්නේ ද එයයි. පවුල වනාහි සමාජයක වැදගත් ම ඒකකය බව නො රහසකි. යහපත් පවුල් ජීවිතයක් ගතකිරීම සෑම කෙනෙකුගේ ම ඉමහත් අපේක්ෂාවකි. යථෝක්ත කරුණු තුළින් යහපත් පවුල් ජීවිතයක් ගත කිරීමට අපේක්ෂිත කාන්තාවන්ට බුදුසමය

ලබා දී ඇති උපදෙස් පෙන්වා දී ඇත. මෙම උපදෙස් ලබාදීම තුළින් බුදුසමය අපේක්ෂා කරන්නට යෙදුණේ පවුල් ජීවිතය තුළ පැවතිය යුතු සාමකාමීත්වයයි. එමෙන් ම යහපත් පවුල් ජීවිතයක් ගතකිරීම සඳහා කාන්තාවගෙන් ලැබෙන සුවිශේෂී දායකත්වය ද යථෝක්ත කරුණු තුළින් ගම්‍යමාන වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ

### ප්‍රාථමික මූලාශ්‍රය

*අංගුත්තර නිකාය I.* (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*අංගුත්තර නිකාය IV.* (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*අංගුත්තර නිකාය V.* (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*දීඝනිකාය II.* (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*දීඝනිකාය III.* (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*මජ්ඣිම නිකාය III.* (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*සංයුත්ත නිකාය I.* (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*සංයුත්ත නිකාය VI.* (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

### ද්විතීයික මූලාශ්‍රය

බෂාම්. (2012). *අසිරිමත් ඉන්දියාව.* කොළඹ: ගොඩගේ පොත් මැදුර.

වජිරා සිල්මාතාව, පානදුරේ. (2003). *භික්ෂුණී වංශය.* කොළඹ: සූරිය ප්‍රකාශකයෝ.

විජයවර්ධන, ඇම්. ඩී. (2004). *බුදුදහමින් විමුක්තිය ලද කාන්තා සමාජය.* කොළඹ: ගොඩගේ පොත් මැදුර.

**ශබ්ද කෝෂ**

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ. (2016). *පාලි-සිංහල අකාරාදිය.* කොළඹ: ගුණසේන පොත් සමාගම.

මලලසේකර. ජී. පී. (2014). *ඉංග්‍රීසි-සිංහල ශබ්දකෝෂය.* කොළඹ: ගුණසේන පොත් සමාගම.

ලියනගේ, සිරි. *බෞද්ධ සිංහල ශබ්දකෝෂය 1.* කතෘ ප්‍රකාශන.

ශ්‍රී රාහුල හිමි, බෝරුැක්ගමුවේ. (සම්). (2001). *සිංහල මහා අකාරාදිය.* කොළඹ: ගුණසේන පොත් සමාගම.

Kavanagh, Kathryn. (ed). (1996). O*xford Advanced Learner's Dictionary.* India: oxford university press.